**කටුවන ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 11 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට කටුවන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසානයට කර්මාන්ත ණයහිමියන් රු. 4,854,827 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | වගකීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 04 ක වටිනාකම් එකතුව වූ රු. 2,230,859 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පෙර පාසල් ගොඩනැඟිලි සභාව සතු වත්කම් නොවන නිසා ව්‍යාපෘති 02 කට අදාළව සිදු කළ සංවර්ධන වියදම් ප්‍රාග්ධනිත නොකළ බවත්, ඉතිරි ව්‍යාපෘති 02 කට අදාළ වියදම ඉදිරියේදී ප්‍රාග්ධනිත කරන බව දන්වමි. |
| (iii) | සභාවට අයත් ඉඩම් 04 ක, ට්‍රැක්ටරය, ට්‍රැක්ටර් ටේලර් 02 ක හා ජල බවුසර 03 ක වටිනාකම තක්සේරු කර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවේ. | ඉඩම්, ට්‍රැක්ටර් ට්‍රේලරය හා ජල බවුසර 03 ක් සඳහා තක්සේරු වාර්තා ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බවත්, ලොකු ට්‍රැක්ටරය හා ට්‍රැක්ටර් ට්‍රේලරය අයිතිය පවරා ගත් පසු තක්සේරු කර ගිණුම්ගත කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සඳහා අතිරික්තතා හා ඌණතා වලට හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට විස්තරාත්මකව ඉදිරිපත් කරමි. |
| (ආ) | ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| i. | මු. රෙ. 134 (3) | සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| ii. | මු. රෙ. 571 (3) | වසර දෙක ඉක්මවූ රු. 133,881 ක තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තැන්පත්කරුවන්ට සිහි කැඳවීම් යොමු කළ බවත්, හිමිකම් සඳහා ඉදිරිපත් නොවන තැන්පතු 2020 වර්ෂයේදී සභා ආදායමට ගනු ලබන බව දන්වමි. |
| iii. | මු. රෙ. 702(3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| iv. | මු. රෙ. 1645 (ආ),(ඇ) සහ 1646 | සභාවේ වාහන 18 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,709,899 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 19,982,789 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වෙනත් බදු | 1,024,000 | 1,281,930 | 1,280,940 | 3,010 | 902,200 | 1,088,533 | 1,086,703 | 2,020 |
| කුලී | 15,379,000 | 14,604,499 | 14,288,470 | 1,789,867 | 13,462,100 | 12,646,360 | 12,722,807 | 1,481,747 |
| බලපත්‍ර ගාස්තු | 758,100 | 1,728,657 | 1,456,157 | 401,450 | 724,050 | 1,217,419 | 1,218,119 | 48,950 |
| වෙනත් ආදායම් | 25,928,150 | 33,478,198 | 25,528,311 | 50,354,719 | 17,508,800 | 31,958,936 | 21,467,516 | 43,245,392 |
| එකතුව | 43,089,250 | 51,093,284 | 42,553,878 | 52,549,046 | 32,597,150 | 46,911,248 | 36,495,145 | 44,778,109 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව 2014 වර්ෂයේදී වසම් 08 ක් දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගත්තද වරිපනම් බදු ගැසට් කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | වරිපනම් බදු පැනවීම හා ගැසට් නිවේදනය නිකුත් කිරීම සඳහා සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

**2.2.3 කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------ | --------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට සභාව සතු කඩ කාමර 21 කින් ලැබිය යුතු කඩ කුලී රු. 377,400 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිග කඩ කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ මුදලින් රු. 115,550 ක් අයකර ගත් බවත්, තවදුරටත් හිඟව පවතින රු. 261,850 අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු වාහන කුලී රු. 1,298,957 ක් වූ අතර ඉන් රු. 913,307 ක් වර්ෂ 05 කට වැඩි විය. | හිග කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟයෙන් රු. 368,436 ක් කපා හැරීම සඳහා ආණ්ඩුකාර තුමා වෙත යොමුකළ බවත්, ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | මීද්දෙනිය රථ වාහන නැවතුම් ස්ථානය බදු දීමෙන් ලැබිය යුතු රු. 106,750 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිග කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | 2017 වර්ෂයට අදාළව ලැබිය යුතු මෙම හිඟයෙන් ආරක්ෂිත ඇපය අඩු කළ පසු හිඟය රු. 90,750 ක් බවත්, අයකර ගැනීම සඳහා නඩු පවරා ඇති බව දන්වමි. |

**2.2.4 බලපත්‍ර ගාස්තු හා දැන්වීම් පුවරු ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | ----------------------------- |
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු රු. 373,250 ක දැන්වීම් පුවරු ගාස්තු සහ ඉකුත් වර්ෂයකදී ලැබිය යුතු රු. 28,200 ක වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිග බලපත්‍ර ගාස්තු ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ දැන්වීම් පුවරු ගාස්තු වලින් රු. 149,500 ක් අයකර ගත් බවත්, හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු වලින් රු. 13,150 ක් ව්‍යාපාර වසා දැමීම මත කපා හැරීම සඳහා ආණ්ඩුකාර තුමාට යොමු කළ බවත්, ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ----------------------------- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 1,955,283 ක් හා රු. 42,423,866 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට ප්‍රධාන ලේකම්වරයාට යොමුකල යුතුවේ. | ලැබිය යුතු යුතු මුද්දර ගාස්තු වලින් රු. 3,500,000 ක් අයකර ගෙන ඇති බවත්, හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු සඳහා අදාළ ආයතන වෙත ඉල්ලීම් කර ඇති බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 3.1 කාර්ය සාධනය

---------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------------------- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කරුණු 29 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | දකුණු පළාත් සම්මත අතුරු ව්‍යවස්ථාවේ අතුරු ව්‍යවස්ථා 29 ක් වැලඳගෙන ඇති බවත්, ප්‍රචාරක පුවරු සම්බන්ධව අංක 520/7 හා 1988.08.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 37 වන අතුරු ව්‍යවස්ථාව වැලඳගෙන ඇති බව දන්වමි. |

#### (ආ) අපේක්ෂිත ඉලක්ක ලඟාකර නොගැනීම

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | -------------------------- |
| සමාලෝචිත වර්ෂයට අයවැය මඟින් ප්‍රතිපාදන සලසා තිබූ රු. 5,618,533 ක වටිනා ව්‍යාපෘති 42 ක් ක්‍රියාත්මක නොකර ප්‍රතිපාදන සලසා නොතිබූ ව්‍යාපෘති 08 ක් රු. 1,921,115 ක වියදමක් දරා ක්‍රියාත්මක කර තිබුණි. | අයවැය ලේඛනයෙහි ඇතුළත් කර ඇති සංවර්ධන යෝජනා ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. | අයවැය ලේඛනයේ ඇතුළත් නොවූ ප්‍රාග්ධන ව්‍යාපෘති කාලීන අවශ්‍යතාවය මත සිදු කර ඇත. |

#### (ඇ) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම

-----------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------------------- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | සිව් අවුරුදු සැලැස්ම තුළ දිගු කාලීන සැලැස්මක් සකස් කර නොතිබුණු බවත්, 2021 වර්ෂය සඳහා තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් වන පරිදි සිව් අවුරුදු සැලැස්මක් සකස් කරන බව දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ ජංගම ගිණුම් 05 ක පැවති අතිරික්ත මාසික සාමාන්‍ය මුදල් එකතු ශේෂය රු. 3,995,221 ක් ඵලදායී ආයෝජන මාර්ගවල යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ජංගම් ගිණුම් වල පවතින අතිරික්ත මුදල් ආයෝජනය කර ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | දෛනික සේවකයින්ට වැටුප් ගෙවීම, ඉටු කළ කර්මාන්තවල බිල්පත් පියවීම හා හදිසි ආපදා තත්ත්වයන් සඳහා එකවර මුදල් ලබා ගැනීමේ අපහසුතාවය මත මුදල් ශේෂ තබාගෙන ඇති බව දන්වමි. |
| (ආ) | ඉකුත් වර්ෂයන් වලදී කඩ කාමර 05 කින් ලැබිය යුතු එක්වන් මුදල් රු. 8,745,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු රු. 200,000 ක් සඳහා නඩු පවරා ඇති බවත්, ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට සමත මණ්ඩලය වෙත යොමු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 07 ක් පිරවීමට හා අතිරික්තතා 26 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක අතිරික්තතා විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | එක් පුරප්පාඩුවක් සම්පූර්ණ කර ගත් බවත්, ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය පරිදි සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබූ අතර ඇමුණුම 02 ආකෘතිය පරිදි සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල ගිවිසුම් හා සැලසුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. | කාර්යසාධන ගිවිසුම් හා මානව සම්පත් සැලැස්ම ඉදිරියේදී සකස් කරමි. |

(ආ) **සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසානයට නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,600,289 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකරගත යුතු ශේෂ වලින් උත්සව අත්තිකාරම් රු. 25,000 ක්, විශේෂ අත්තිකාරම් රු. 8,000 ක් හා ආපදා ණය රු. 1,542,689 ක් අයකර ගෙන ඇති බව දන්වමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මිද්දෙණිය සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 09 ක් මහජන බැංකුව වෙත කුලියට දීමට අත්සන් කළ ගිවිසුමෙහි වලංගු කාලය ඉකුත් වර්ෂයේ අවසන්ව තිබුණද ඒ සඳහා අළුතින් ගිවිසුම්ගත වී කාමර කුලී සංශෝධනය නොකිරීම හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි. | ගිවිසගත් කාලය අවසානයේදී ගිවිසුම් අළුත් කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සුදුසු ගිවිසුම් කොන්දේසි යටතේ ගිවිසුම්ගත වීමට කටයුතු කරමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වාහන නඩත්තුව හා අළුත්වැඩියාව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු වාහන 03 ක් දීර්ඝ කාලයක සිට භාවිතයට නොගෙන තිබෙන අතර, ඒවා අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | යාන්ත්‍රික ඉංජිනේරු වරයාගේ නිර්දේශ ලබාගෙන ඉදිරි කටයුතු කරමි. |

**3.5.2 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු වාහන 04 ක සහ සුසාන භූමි 57 ක නීත්‍යානුකූල අයිතිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | වාහනයක අයිතිය පවරා ගෙන ඇති බවත්, ඉතිරි වාහන හා ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කරමි. |

**3.5.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේදී සභාවට භාර දී තිබුණු වටිනාකම රු. 9,984,179 ක් වූ කටුවන සති පොළ ගොඩනැඟිල්ල වර්ෂ 05 ක කාලයක් සහ කිරම බස් නැවතුම්පලේ කඩ කාමර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිශ්කාර්යව පැවතුණි. | සභාව සතු වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | ජලය නොමැති වීම හා භූමියේ කැටගල් ඇල්ලීම ප්‍රමාද වීම මත පොළ ගොඩනැගිල්ල විවෘත නොකළ බවත්, බස් නැවතුම්පොළ කඩ කාමර තක්සේරු කිරීම සඳහා ලිපි සකසමින් සිටින බව දන්වමි. |